# අධ්‍යාපනය හා සමාජානුයෝජනය

මහකච්චකොඩියේ පඤ්ඤාසේකර හිමි

## ප්‍රවේශය

මිනිසා මුලින් ම සමාජයට එක් වන්නේ ස්වාභාවික සත්ත්වයකු ලෙසට යි. එසේ ස්වාභාවික සත්ත්වයකු ලෙසින් සමාජයට එක් වන මිනිසා තමා අවට ඇති සමාජ හා පරිසර සාධක මෙන් ම සංස්කෘතිය වැනි උපාංගවලින් සහ ඔවුන් කරන ක්‍රියා දෙස බලමින් අනුකරණවාදී ව සමාජය සමග සම්බන්ධතා දක්වයි. සමාජයට එක්වන මිනිසාට විවිධ අවශ්‍යතා ස්වාභාවික ව ඇති වේ. නින්ද, ආහාරපාන, ලිංගිකත්වය වැනි අවශ්‍යතා ඊට උදාහරණ වේ. මෙම ස්වභාවික අවශ්‍යතා සමාජීය මිනිසා ඉටු කර ගන්නේ තමා අයත් වන සමාජයීය පරිසරයට අනුව යමින් අනුකරණවාදී ව ය. එය සමාජානුයෝජනය නමින් හැඳින්විය හැකි ය. එම සමාජානුයෝජන ක්‍රියාවලිය සමාජයෙන් සමාජයට සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වේ. එමෙන් ම විවිධ වේ. එහෙත් සෑම සමාජයක ම සමාජානුයෝජනය එහි සංස්කෘතිය සමග බද්ධ ව පවති.

සමාජානුයෝජනය යනු ඉගෙනුම් ක්‍රියාවලියක් ලෙසින් හඳුනාගත හැකි ය. පුද්ගලයා උපතේ සිට මරණය දක්වා ම ඉගෙන ගනී. පළමු ව තම පවුලේ සාමාජිකයන්ගේ සමාජයට අනුගත වීමට අවශ්‍ය ධර්මතා දරුවන් විසින් අභ්‍යන්තරීකරණය කර ගනී. දෙමාපියන්, සහෝදර සහෝදරියන්, නෑදෑයන්ගේ උච්චාරණ විලාසය, වචන, හැසිරෙන විලාසය, ඇවිදින ආකාරය දෙස බලා ඒ අනුව තම චර්යා සකස් කර ගනියි. ඒ අනුව සමාජානුයෝජනය පුද්ගලයෙකුගේ චර්යා සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් සිදු කරන බව හඳුනා ගත හැකි ය.

ප්‍රාථමික සමාජානුයෝජනය විධිමත් අධ්‍යාපන අවස්ථාවට පෙරහුරුවක් ලෙසින් සමාජ විද්‍යාඥයන් හා මනෝ විද්‍යාඥයන් විසින් පෙන්වා දෙනු ලැබ ඇත. එහි දී දෙමාපියන්ගේ හා පවුලේ අනෙකුත්

සාමාජිකයන්ගේ කායික හා මානසික චර්යා වැදගත් වී ඇත. ඒ අනුව දෙමාපියන් දරුවකු ළදරු අවධියේ සිට රැකබලා ගැනීමේ දී හා පෝෂණය කිරීමේ දී සමාජානුයෝජන ක්‍රියාවලිය නිසි ආකාරයෙන් සිදු කළ යුතු ව පවතී. එය කුමන සාධක ඔස්සේ කළ යුතු ද යන්න පරීක්ෂා කළ යුතු වේ. ඒ අනුව අධ්‍යාපනය සඳහා සමාජානුයෝජනය ක්‍රියාවලිය හඳුනා ගැනීමත්, ළමා අවධියේ සමාජානුයෝජන සඳහා පවුලේ සාමාජිකයන්ගේ දායකත්වය අධ්‍යයනය කිරීමත්, එමගින් අධ්‍යාපනයට ඇති බලපෑම පරීක්ෂා කිරීමත් මෙම පර්යේෂණයෙන් සිදු වේ.

**සාකච්ඡාව**

සමාජානුයෝජනය හා අධ්‍යාපනය අතර ඇති සම්බන්ධතාව අධ්‍යයනය කිරීමේ දී සමාජානුයෝජනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න මූලික ව සාකච්ඡා කළ යුතු ව පවතී. ඒ අනුව සමාජානුයෝජනය සම්බන්ධයෙන් විවිධ නිර්වචන හා න්‍යායාත්මක විග්‍රහ කිහිපයක් හඳුනා ගත හැකි ය. සමාජානුයෝජනය පුද්ගලයෙක් සමාජයට අනුගත කරන ක්‍රියාවලිය වේ. සමාජය හා සමාජානුයෝජනය එකිනෙකට සම්බන්ධ වන්නේ කෙසේ ද යන්න අර්ථ දක්වන ක්‍රෙච් ආදීන් (Krech et al.) ඉදිරිපත් කරන අදහස මගින් එය හඳුනා ගත හැකි ය.

උත්පත්තියේ සිට මරණය දක්වා පුද්ගලයෙකු සමාජයේ සාමාජිකයකු වශයෙන් ජීවත් වේ. මෙම සමාජයේ මූලික ගුණාංගය වන්නේ පොදු අපේක්ෂණ කිහිපයක් වටා පුද්ගල අන්තර් ක්‍රියාකාරීත්වයන් සංවිධානය කිරීම යි. මේ සඳහා පොදු විශ්වාස, ආකල්ප හා ක්‍රියාකාරීත්ව සාමූහික ව හුවමාරු කර ගැනීම අවශ්‍ය ය (Krech et al, 1962: 308).

උක්ත අර්ථකථනයෙන් පෙන්වා දෙන්නේ පුද්ගලයෙක් සමාජය තුළ උපතේ සිට මරණය දක්වා ම ජීවත් වන අතර සමාජයේ අනෙකුත් සමාජිකයන් සමග සම්බන්ධතා දක්වන බවයි. එහි දි කිසියම් සමාජයක් විසින් පිළිගත් අපේක්ෂණ සාධනය කර ගැනීමට පුද්ගලයාගේ දායකත්වය ඉතා වැදගත් ය. සමාජය විසින් පිළිගත් පොදු විශ්වාස, ආකල්ප හා ක්‍රියාකාරීත්ව සාමූහික ව හුවමාරු කර

ගැනීම සමාජ අපේක්ෂණ සාධනය කර ගැනීමට ඉවහල් වේ. එම ක්‍රියාවලිය පුද්ගලයා සමාජයට අනුගත කිරීමේ ක්‍රියාවලියේ මූලික අවස්ථාවයි.

සමාජයේ සාමූහිකත්වය පවත්වා ගැනීමේ දී අනුගත ක්‍රියාවලිය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. ඒ සඳහා අධ්‍යාපනය ඉතා වැදගත් මෙවලමකි. එමිල් ඩර්ක්හයිම් (Emil Durkheim) පෙන්වා දෙන්නේ සමාජ සංයුක්තතාව රඳා පවතින්නේ අධ්‍යාපනය ක්‍රියාවලියේ සාධනීය මට්ටම මත බව යි.

අධ්‍යාපනය යනු වැඩිහිටි පරම්පරාවන් විසින් සමාජ ජීවිතයට සූදානම් නො වී ඇති බාල පරම්පරාව වෙත පවත්වා ගෙන යන බලපෑමයි. සමස්ත වශයෙන් දේශපාලන සමාජය විසින් ද, ඔහුට අනාගතයේ ජීවත් වීමට සිදු වන සුවිශේෂ වටපිටාව මගින් ද, අපේක්ෂා කරන ශාරීරික වූත්, බුද්ධිමය වූත්, සදාචාරාත්මක වූත් වටිනාකම් මතු කර ගැනීමත්, දියුණු කර ගැනීමක් වේ ( Durkheim,1956:71).

ඉහත අර්ථකථනයෙන් හඳුනා ගත හැකි වන්නේ වැඩිහිටි පරම්පරාව විසින් බාල පරපුර වෙත සමාජයේ පිළිගත් සංස්කෘතිකාංග ස්වකීය බුද්ධිමය හා සදාචාරාක්මක වටිනාකම් දියුණු කර ගැනීමට මග පෙන්වීම හා පුරුදු පුහුණු කිරීම අධ්‍යාපනයෙන් ලබා දෙන බවයි. ඒ අනුව පෙනී යන්නේ අධ්‍යාපනය යනු පුද්ගලයෙකු සමාජයට අනුගත කිරීමේ ක්‍රියාවලිය සඳහා දායක වන ප්‍රධාන මාධ්‍යය කි.

අධ්‍යාපනය එසේත් නැති නම් ඉගෙනීමෙන් ලබා දෙන දැනුම හා පුහුණුව පුද්ගලයෙක් සමාජයට අනුගත වීම සඳහා අවශ්‍ය ධර්මතා පමණක් ම කියා දෙන කාරකයක් ලෙසින් හැඳින්වීම නො කළ යුත්තකි. අධ්‍යාපනයෙන් විෂය දැනුම හා වෘත්තිමය අවශ්‍යතා මත පදනම් වූ පුහුණුවක් ලබා දීම ද සිදු වේ. මස්ග්‍රෝව් සහ ටේලර් විසින් පෙන්වා දෙනු ලබන්නේ,

විෂය ඉගැන්වීම හා සදාචාර පුහුණුව කෙරෙහි ගුරුවරුන් වැඩි අවධානයක් යොමු කළ අතර, සමාජ පුහුණුව පවුල් ජීවිතය, පුරවැසි බව හා සමාජ සංවර්ධනය කෙරෙහි අඩු අවධානයක් යොමු කර ඇත (Musgrove & Tayler, 1969: 39-41).

පුද්ගලයෙකුගේ සමාජගත ජීවිතයට අවැසි ධර්මතා කියා දීම සමාජානුයෝජනයේ දී සිදු වුවත් ගුරුවරුන් ඇසුරෙන් ලබා ගන්නා අධ්‍යාපනික වටිනාකම්වලින් පූර්ණ දැනුමක් හා පුහුණුවක් සමාජගත ජීවිතයට ලබා ගන්නේ ය යන අදහස මස්ග්‍රෝව් සහ ටේලර් ප්‍රතික්ෂේප කර ඇත. සමාජ ජීවිතයේ කාර්යභාරය පුළුල් පරාසයක් කරා විහිද යයි. සමාජානුයෝජන කාරකයක් ලෙසින් පාසලින් ලබා ගන්නා අධ්‍යාපනය එක්තරා වයස් කාණ්ඩයකට පමණක් සීමා වූවකි. එහෙත් සමාජ ජීවිතය මරණාන්තය දක්වා ම උරුම වූවකි. එම නිසා පුද්ගලයා සමාජයට අනුගත වීමේ දී මුළු ජීවිතය පුරා ම ධර්මතා ඉගෙන ගනිමින් හා පුහුණු වෙමින් සමාජය පිළිගත් ධර්මතා හා බද්ධ ව සිටී.

**සමාජානුයෝජනයේ න්‍යායාත්මක ප්‍රවේශය**

සමාජානුයෝජන ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමේ දී ඒ සම්බන්ධයෙන් ගොඩ නැගී ඇති න්‍යායාත්මක විග්‍රහ අධ්‍යයනය කිරීම ද ඉතා වැදගත් වේ. සමාජානුයෝජනය පිළිබඳ ව න්‍යාය රැසක් ගොඩ නැගී ඇති අතර එයින් කිහිපයක් පමණක් මෙම අධ්‍යයනයේ දී සාකච්ඡා වේ. ඒ අතුරින්

- සී. එච්. කූලි ඉදිරිපත් කරන කැඩ පතේ පිළිරුව
- ජෝර්ජ් හර්බට් මීඩ් ඉදිරිපත් කරන නාට්‍ය හා ක්‍රීඩාව
- අර්වින් ගොෆ්මාන් ඉදිරිපත් කරන නාට්‍යමය ප්‍රවේශය
- සිග්මන් ප්‍රොයිඩ් ඉදිරිපත් කරන මනෝ විශ්ලේෂණවාදී න්‍යාය

සී.එච්. කූලි 1902 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද "Human Nature and Social Order" නම් කෘතියෙන් කැඩපතේ පිළිරුව (looking glass self) නම් සංකල්පය ඔස්සේ පෙන්වා දෙන්නේ ආත්ම සංඥතාව වර්ධනයට සමාජානුයෝජන ක්‍රියාවලිය ඉතා වැදගත් බවයි. ආත්ම නම් වු සංකල්පය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන මොහු පෙන්වා දෙන්නේ ළමයෙකුගේ මුල් අවුරුදු තුන ආත්මය පිළිබඳ

සවිඥානික බව ඉතා අඩු මට්ටමකින් පවතින අතර ළමයා වයසින් වර්ධනය වනවාත් සමග එය සංවර්ධනය වන බවයි. එසේ වර්ධනය වන්නේ ජීව විද්‍යාත්මක ව නො ව සමාජීයව ලබා ගන්නා දැනුමකින් බව මොහු පෙන්වා දේ (Cooly, 1902). පුද්ගලයෙකු කැඩපතෙන් තමා දෙස බැලීමෙන් උපකල්පනය කරන ප්‍රධාන කාරණා තුනක් ඇති බව කූලි පෙන්වා දී තිබේ. එනම්,

- තමා අන් අයට පෙනී සිටිය යුතු ආකාරය ගැන සිතීම
- එම පෙනුමේ විනිශ්චය ගැන සිතීම
- අන් අයගේ විනිශ්චයෙන් තමන්ගේ ආත්මය වර්ධනය කර ගැනීම යනුවෙනි (Cooly, 1902).

මෙම න්‍යායයට අනුව කූලි පෙන්වා දී ඇත්තේ මනස මානසික වන අතර එය සමාජ අන්තර් ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් බව යි. ළමයින් ලෙස ආරම්භයේ සිට ම මිනිසුන් තම සමාජකරණයේ සන්දර්භයෙන් ම තමන්ව නිර්වචනය කර ගනී.

ජෝර්ජ් හර්බට් මීඩ් (1934), කූලි විසින් පෙන්වා දුන් සංකල්පය තවදුරටත් විශ්ලේෂණය කරමින් පෙන්වා දෙන්නේ පෞරුෂ වර්ධනයට සමාජානුයෝජනය බලපාන බව යි. පුද්ගල පෞරුෂය සමාජයේ නිෂ්පාදනයක් වන අතර එය ඔහු විසින් ''නාට්‍ය හා ක්‍රීඩාව''(play and game) නම් සංකල්පය මගින් විස්තර කර තිබේ. පුද්ගලයෙක් සමාජ ගත වීමට අවැසි අගනාකම් ඉගෙන ගනිමින් වෙනත් අයකුගේ කාර්ය කොටස් පවරා ගනිමින් ස්වයං සංකල්ප ඇති කර ගැනීම නාට්‍ය අවධිය වන අතර ක්‍රීඩා යන්නෙන් කාර්ය කොටස් පොදුකරණයකට හෙවත් සාමාන්‍යකරණයට ලක් කිරීම අදහස් කෙරේ (Mead, 1934). දරුවෙකු තම මවගේ, පියාගේ හෝ වෙනත් ඕනෑ ම කෙනෙකුගේ කාර්ය කොටස් ඉගෙන ගනිමින් ඒවා පොදුකරණයට ලක් කොට සමාජ ජීවිතයේ භාවිතයට ගනී. ඒ අනුව දාරක සමාජානුයෝජනයේ දී ප්‍රාථමික සමාජානුයෝජන කාරකයක් ලෙසින් පවුල මුල් කර ගෙන පුද්ගලයෙකු සමාජගත වන බව මෙම න්‍යායයෙන් පැහැදිලි කර ඇත.

අර්වින් ගොෆ්මාන් සමාජානුයෝජනය පිළිබඳ ව මීඩ්ගේ න්‍යායාත්මක විග්‍රහය තවදුරටත් දියුණු කරමින් ''නාට්‍යමය ප්‍රවේශය'' (Drammatical approach) හෙවත් නාට්‍යානුසාරී එළඹුම යන න්‍යායය හඳුන්වා දී තිබේ. මිනිසුන්ගේ සමාජ ජීවිතය රඟමඬලක් හෙවත් වේදිකාවක් වන අතර එහි රඟ දක්වන පුද්ගලයා නළුවෙක් වේ. සමාජයේ හැසිරෙන පුද්ගලයින් දෙස බලා සිටින අනෙකුත් සියලු දෙනා ප්‍රේක්ෂකයන් ලෙසින් පෙන්වා දී ඇත. මෙම න්‍යායයෙන් වැඩිදුරටත් පෙන්වා දෙන්නේ පුද්ගලයකු සමාජ අන්තර් ක්‍රියාවලට සහභාගි වීමේ දී තමා නළුවෙකු ලෙසත් අන් අය ප්‍රේක්ෂකයන් ලෙසත් සැලකෙන බව යි. නළුවා අදහස් රැසක් ප්‍රේක්ෂකයා වෙත ගෙන ඒමට යත්න දරයි. නළුවා කරන්නට යන්නේ කුමක් ද පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ප්‍රේක්ෂකයෝ උත්සාහ ගනිති. ප්‍රේක්ෂකයෝ නම් ඒ සමාජයේ සාමාජිකයෝ ය. ඉන් සංස්කෘතිය අදහස් වේ. ඕනෑ ම සමාජ අන්තර් ක්‍රියාවක මේ ලක්ෂණ දැකිය හැකි බව ගොෆ්මාන් පෙන්වා දෙයි.

මනෝ විශ්ලේෂණවාදී න්‍යායය පදනම් කර ගෙන සිග්මන් ෆ්‍රොයිඩ් (Sigmund Freud) පෙන්වා දී ඇත්තේ මිනිස් සිත පෞරුෂ සංවර්ධනයේ දී වැදගත් වන බවයි. පුද්ගල පෞරුෂය සකස් වන්නේ පුද්ගල සමාජානුයෝජන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙසිනි. ෆ්‍රොයිඩ් පුද්ගල පෞරුෂය පැහැදිලි කරන මූලික ස්තර තුනක් පෙන්වා දී තිබේ. එනම්,

- Id - ඉඩ්
- Ego - ඊගෝ
- Super Ego - සුපර් ඊගෝ වශයෙනි (Freud, 1923).

මනසේත්, පෞරුෂයේත් ඉතා ම ප්‍රාථමික කොටස ඉඩ් (Id) සංස්කාරය වන අතර එය පුද්ගලයා උපන් අවස්ථාවේ සිට ම පැවත පසු ව අහංභාවය හා උපරි අහංභාවය බවට පරිවර්තනය වේ. පුද්ගලයාගේ මූලික ජීව විද්‍යාත්මක ආවේග වන කුසගින්න, පිපාසය වැනි ප්‍රභව ස්ථානය ඉඩ් වේ. මෙම ආවේග වහාම සන්තර්පනය කිරීමේ කැමැත්ත ඉඩ්ගේ මූලික අංග ලක්ෂණයකි. මෙහි දී සදාචාරය

හෝ හේතු ප්‍රත්‍යය හෝ අනුන් ගැන තැකීමක් හෝ නැත (අබේපාල, 2010). බිළිඳු වියේ බාලයාගේ මනස ක්‍රියාත්මක වන්නේ ඉඩ්වලින් පමණි. අවු. 2 පමණ දක්වා ළමයා ඉඩ් ගුලියක් වශයෙන් උපමා කළ හැකි ය.

පෞරුෂයේ ඊළඟ කොටස අහංභාවය හෙවත් Ego වේ. බිළිඳු වියේ දී මූලික ජීව විද්‍යාත්මක ආවේග සන්තර්පණය පරම ආධ්‍යාශය කොට ගත්ත ද මෙම අවධියේ දී බාහිර පරිසරයේ බලවේග කෙරේ සැලකිලිමත් වේ. මූලික ජීව විද්‍යාත්මක ආවේග ඉටු කර ගැනීමේ දී කිසියම් පාලනයක් අවශ්‍ය බව තේරුම් ගනී. මෙම අවස්ථාවේ දී තර්කානුකූලවත් හේතු ප්‍රත්‍ය අනුවත් ක්‍රියා කිරීමට පෙළඹේ. මෙලෙස ආශා, ආවේග කුමන අවස්ථාවක දී කවර ආකාරයට ඉටු කර ගත යුතු දැයි අහං භාවය හෙවත් 'Ego' මගින් මෙහෙය වී ක්‍රියාත්මක භාවයට පත් කෙරේ. මෙලෙස සුඛ වේදනා මූලධර්මය මගින් මෙහෙය වන ඉඩ් අහංභාවය මගින් පාලනය කරන බව පෙනී යයි. Ego විසින් හොඳ නරක පෙන්වා දී හරි වැරදි, සිරිත් විරිත් සදාචාරයට අනුව ඉඩ් (Id) ව පාලනය කරනු ලැබේ (Freud, 1923).

ප්‍රොයිඩ්ට අනුව පෞරුෂයේ තුන්වැනි අංගය වන්නේ උපරි අහං භාවය හෙවත් (Super Ego) වේ. දෙමාපියන් හා සමාජය විසින් පුරුදු පුහුණු කර ගත් සමාජ අගයයන්, සාරධර්ම නිරූපණය වන්නේ ද, පාලනය වන්නේ ද උපරි අහංභාවය මගිනි (Freud, 1923). කිසියම් ක්‍රියාවක හරි හෝ වැරදි බව විනිශ්චය කරන්නේ උපරි අහංභාවය මගිනි. පුද්ගලයා සමාජයේ දක්නට ලැබෙන යහපත් හැසිරීම් ගුණධර්ම තම ජීවිතයට ආත්මීකරණය සිදු කරන්නේත්, හෘදය සාක්ෂියට අනුව කටයුතු කරන්නේත් උපරි අහංභාවය මගිනි (Freud, 1923).

**අධ්‍යාපනය හා ප්‍රාථමික සමාජානුයෝජනය**

පුද්ගලයෙකුගේ ඉගෙනුම් ක්‍රියාවලියේ තිඹිරිගෙය වන්නේ පවුල ය. පවුලේ විශේෂිත ආධ්‍යාපනික ශෛලියකින් සමාජකරණ ක්‍රියාවලිය සිදු කරනු ලබයි. පවුල අවිධිමත් අධ්‍යාපනය ලබා දෙන සංස්ථාවක් ලෙසින් සමාජවිද්‍යාඥයින් පෙන්වා දී තිබේ. පවුල සැබෑ සමාජකරණ පාසලක් වන අතර ආදරණීය හැඟීම් ඇති කරන පරිසරයකි (Osterrieth, 1973). විවිධ සමාජ හා සංස්කෘතික

වෙනස්කම්වලින් යුත් සමාජයක වුවත් දරුවා සමාජගත කිරීමේ හා සමාජයට ගැළපෙන ආකාරයෙන් සකස් කිරීමේ සාධකය වන්නේ පවුල ය. පවුල තුළ පෝෂණය වන දරුවා පවුල් සංස්ථාවේ පිළිගත් නීතිරීති අගනාකම් හා ධර්මතා උකහා ගැනීම සමාජගත වීමට හැකි සංවේදනාත්මක පුද්ගලයෙක් බවට පත් වේ. ''අන් අයගේ අවශ්‍යතා සමග සන්නිවේදනය කිරීමේ හැකියාව දරුවෙකුගේ සහජ හැකියා වන නමුත් එය පවත්වා ගෙන යනු ලබන්නේ ඔහුගේ හෝ ඇයගේ ජීවිතයේ වැඩිහිටියෙකු වන මව්පියන්ගේ සන්වේදන හැසිරීම් ප්‍රදර්ශනය කරන්නේ නම් පමණි''(Petrovai, 2012: 9).

සමාජ විද්‍යාඥයන් පෙන්වා දෙන ආකාරයට පවුල මගින් සමාජමය කාර්ය තුනක් සම්පූර්ණ කෙරේ. එනම්,

- ජීව විද්‍යාත්මක ප්‍රජනනය
- අපරිණත දරුවන් පෝෂණය කිරීම
- සමාජානුයෝජනය හා අධ්‍යාපනය යනුවෙනි (සේනාධීර හා හේවාපතිරණ, 2010: 53).

උක්ත කාර්යය සමාජයට උපයුක්ත වන සේ පුද්ගලයෙකු සමාජගත කිරීමට අවැසි මූලික පුහුණුව පවුලෙන් සිදු වන බව හඳුනා ගත හැකි ය. එය තවදුරටත් සනාථ කර ගත හැකි අදහසක් පාමර් (1970) පෙන්වා දී තිබේ.

ඇත්ත වශයෙන් ම පවුල හුදෙක් දරුවන් බිහි කරන ආයතනයක් ම නො වේ. දරුවන් සමාජයට ගැළපෙන සහ ප්‍රයෝජනවත් වන ආකාරයට අනුයෝජනය කරන ආයතනයක් ද වෙයි. සමාජානුයෝජනය මගින් කරනු ලබන්නේ, සමාජය තුළ විද්‍යාමාන චාරිත්‍ර වාරිත්‍ර ඇගයුම් සහ සංස්කෘතිය, නව පරම්පරාව පෝෂණය කිරීමයි. මෙය අධ්‍යාපනික ක්‍රියා මාර්ගයක් වෙයි. සමාජානුයෝජනය සමාජයට මෙන් ම පුද්ගලයාට ද බෙහෙවින් වැදගත් වෙයි. පුද්ගලයාගේ චර්යාව සමාජයට අනුරූප වන ආකාරයට හැඩ ගැස්වීමට තිබෙන එක ම මාර්ගය එය වෙයි (Farmer, 1970: 77).

බෞද්ධ සමාජ දර්ශනයට අනුව සමාජානුයෝජන ක්‍රියාදාමය පවුල් මුල් කර ගෙන ආරම්භ වන අතර පවුලේ සාමාජිකයන්ගේ කාර්ය කොටස් නිසි අයුරින් ඉටු වීම එහිදි වැදගත් ය. පවුලේ කාර්යභාරයේ ප්‍රමුඛයන් වන්නේ දෙමාපියන් ය. දෙමාපියන් විසින් චාරිත්‍ර වාරිත්‍ර සහ සමාජය විසින් පිළිගත් සංස්කෘතිකාංග විධිමත් ව පුහුණු කරන්නේ දෙමාපියන් ය. එම නිසා බුදුදහමේ දෙමාපියන් පූර්වාචාරීන් ලෙසින් හඳුන්වයි.

'බ්‍රහ්මාති මාතා පිතරෝ පුබ්බාචරියා ච වුච්චරෙ ආහුනෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා' (අං. නි, තික නිපාතය, 1972, බු.ජ.ත්‍රි.ග්‍ර.මා: 245)

මව්පියෝ දරුවන්ට මෙත්තා කරුණා මුදිතා ගුණයෙන් යුත් බ්‍රහ්ම යයි ද, පූර්ව ආචාර්යයන් ලෙසින් ද, ඉතා මහන්සියෙන් සියලු දේ සම්පාදනය කරන ආහුනෙය්‍යයාදි, අනුකම්පාවෙන් දරුවන් රැකබලා ගන්නාහු යැයි ද ඉන් අදහස් වේ.

දෙමාපියන්ගෙන් දරුවනට ඉටු විය යුතු යුතුකම් හා දරුවන් දෙමාපියන්ට ඉටු කළ යුතු වගකීම් පිළිබඳ සිඟාලෝවාද සූත්‍ර දේශනාවෙන් පෙන්වා දී තිබේ. දෙපාර්ශවය අතර අන්‍යෝන්‍ය වශයෙන් කාර්ය කොටස් නිසි ආකාරයෙන් සැපිරීම මුල් කර ගෙන ගොඩ නැගෙන සමාජ සංයුක්තතාව එයින් අවධාරණය වී ඇත. විශේෂයෙන් ම දෙමාපියන් දරුවන්ට කියා දෙන ධර්මතා මත දරුවාගේ ශික්ෂණය ගොඩ නැගෙන බව බුදුදහමේ ඉගැන්වීම යි.

ප්‍රාථමික සමජානුයෝජන කාරකයක් ලෙස පවුල, අධ්‍යාපනය සඳහා වැදගත් කාර්ය කොටස් කිහිපයක් ඉටු කරන බව මනෝ විද්‍යාවේ මෙන් ම සමාජ විද්‍යාවේ ද පෙන්වා දී ඇත. එම කාර්යය කොටස් කරුණු වශයෙන් මෙසේ ය. එනම්,

- චාලක හැකියා වර්ධනය කිරීම
- භාෂා හැකියා වර්ධනය
- චිත්තවේග වර්ධනය

- බුද්ධිමය වර්ධනය
- සදාචාර වර්ධනය
- සමාජ හුරුව ලබාදීම
- පෞරුෂ වර්ධනය යනුවෙනි (සේනාධීර හා හේවාපතිරණ, 2010: 56).

උපන් මොහොතේ සිට දරුවන්ගේ චර්යාවන් විදහා දැක්වෙන ස්ථානය නිවස වේ. අතපය සෙලවීම, ඇඬීම, කිරි උරා බීම, වාඩි වීම, නැගිටීම, ඇවිදීම යන චර්යා ඒ අතර ප්‍රධාන වශයෙන් හඳුනා ගත හැකි ය. එම චර්යා ක්‍රමානුකූල ව සකස් කිරීමේ කාර්යය පවුල මගින් සිදු වේ. එමෙන් ම කුඩා දරුවන් ක්‍රීඩාව සඳහා වැඩි නැඹුරුවක් දක්වන නිසා ක්‍රීඩාවට සුදුසු පරිසරයක් සැකසීමෙන් ඔවුන්ගේ චාලක හැකියා වර්ධනය වේ. සමාජානුයෝජනයේ දී ක්‍රීඩාව වැදගත් චර්යාවක් ලෙසින් ලොවෙල් පෙන්වා දී ඇත.

සෑම ළමයෙක් ම සෑම අවස්ථාවක දී හෝ ක්‍රීඩා කරයි. ඇත්තෙන් ම ළමයින් සමාජයේ විවිධ අවස්ථා අත්හදා බලන ප්‍රධානතම මාධ්‍යය ක්‍රීඩාවයි. ක්‍රීඩාව යනු කුඩා ළමයා තුළ අතිමාත්‍ර ව පවත්නා වැඩිමනත් ශක්තිය මුදා හැරීමේ මාර්ගයකැයි යන නිර්වචනය පැරණිතම අදහසකි (ලොවෙල්, 1981: 206).

චාලක හැකියාව දරුවා ලබා ගන්නේ ස්නායු හා පේශී සම්බන්ධීකරණයෙන් ගොඩ නැගෙන ක්‍රියා ලෙස ය. මේ සඳහා කායික වර්ධනය, එනම් බර, උස, ස්නායු හා පේශීවල වර්ධනය මෙන් ම බුද්ධිය, චිත්තවේගීය සමාජයීය වර්ධනය මෙන් ම පෙළඹවීම ද අනිවාර්ය අංග වේ. චාලක ක්‍රියාවල දී පරිසරය පිළිබඳ අත්දැකීම් මදිකම නිසා වැරදීම් මෙන් ම අනතුරු සිදු විය හැකි ය (අබේපාල, 2010: 107). එවැනි අනතුරුවලින් වළක්වා ගනිමින් දරුවාගේ වර්ධනයට දායක වීමේ කාර්යය පැවැරී ඇත්තේ පවුලේ සාමාජිකයන්ට ය.

සේනාධීර හා හේවාපතිරණ (2010) පෙන්වා දෙන්නේ කුඩා ළමයින් ක්‍රීඩා භාණ්ඩ පරිහරණයට කැමැත්තක් දක්වන බවයි. පිරිමි

ළමයි කාර්, බස් ආදී වාහන ක්‍රියා කරවීමට ද, ගැහැනු ළමයින් බෝනික්කන් නැවීම, කැවීම ආදී ක්‍රියාකාරකම්වල නිරතවීමට ද කැමැත්තක් දක්වති. එවැනි ක්‍රියාකාරකම්වලට අවස්ථාව සැලසීම දෙමාපියන්ගේ වගකීමක් වේ. චාලක හැකියා වර්ධනය ක්‍රියාශීලි අධ්‍යාපනයකට ඉතා වැදගත් අවස්ථාවකි. ඒ අනුව චාලක හැකියා වර්ධනයට දෙමව්පියන් විසින් ගත යුතු ක්‍රියාමාර්ග කිහිපයක් පෙන්වා දී තිබේ.

| චාලක හැකියා ලක්ෂණ | චාලක හැකියා වර්ධනය සඳහා ගත යුතු ක්‍රියා මාර්ග |
|---|---|
| අත පය සෙලවීම | මාස 4න් පසු සෙලවීමට සුදුසු වර්ණවත්, ශබ්ද වන සෙල්ලම් බඩු ලබා දීම |
| නැගිටීම | ළමයාට අල්ලා ගෙන නැගිටීමට සුදුසු මේසයක් මත නොකැඩෙන රබර් ක්‍රීඩා භාණ්ඩ තැබීම |
| නැගීම හා බැසීම | දණගාන වයසේ සිට පඩි පෙළවල් නැගීමට, බැසීමට අවස්ථා සලසා නිරීක්ෂණය කිරීම |
| උසක සිට පැනීම | දුර සහ උස පැනීම සඳහා ආරක්ෂිත ස්ථානයක පුළුන් කොට්ට තබා ඉඩ සැලසීම |
| පැද්දීම | ප්‍රෑම් එකක සහ අවුරුදු 2ක් පමණ වන විට ඔන්චිල්ලා-වක පැද්දීම |
| විවිධ ශබ්ද කිරීම | අවට පරිසරයේ පක්ෂීන්ගේ සහ සතුන්ගේ ශබ්ද ඇසී-මේ අවස්ථා සැපයීම |
| විවිධ චර්යා අනුකරණය | සමාජයේ විවිධ භූමිකා රඟපාන අයගේ චර්යා අනුක-රණයට අවස්ථා ලබා දීම |
| විධිමත් ව ලිවීමට අවශ්‍ය ලෙස ඇඟිලි හැසිරවීම | මැටි, ක්ලේ, කඩදාසි, පාට කුරු, ගල්ලෑලි ආදිය උපයෝගි කර, යම් යම් රූප ඇඳීමට, ඇලවීමට සැලැස්වීම |
| බුද්ධිය හා උපකරණ | Building Blocks වැනි ක්‍රීඩා උපකරණ ලබා දී චින්තන ශක්තිය වර්ධනයට උදව් කිරීම |

(සේනාධීර හා හේවාපතිරණ, 2010: 59)

පුද්ගල සන්නිවේදනයේ දී ඇති විධිමත් හා කාර්යක්ෂම ක්‍රමවේදය වන්නේ භාෂා හැකියාව යි. උපතෙන් පසු දරුවකු හැඬීමෙන් පටන් ගන්නා භාෂා සංවර්ධනයේ මුල් පියවර සවන් දීම, කූජනය, ලාලනය හා වචන කථා කිරීම දක්වා පිළිවෙළින් වූ ක්‍රියාවලියක් ලෙස සංවර්ධනය වේ. දරුවා භාෂාව ඉගෙනීම සඳහා යොදවන මුල් ම ශිල්ප ක්‍රමය ඇහුම්කන් දීමයි. මාස දෙකත්, තුනත් අතර වයසේ පසුවන දරුවකු වුව ද වැඩිහිටි ප්‍රතිචාර දක්වයි (අබේපාල, 2010: 103). එම නිසා වැඩිහිටියන්ගේ භාෂා ව්‍යවහාරය දරුවාගේ සමාජානුයෝජන ක්‍රියාවලියට ආධාරයක් විය යුතු ය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (1986) කරන ලද පර්යේෂණයකින් පෙන්වා දී ඇත්තේ භාෂාවෙන් සංජානනය කර ගන්නා කාර්යය කිහිපයක් ඇති බවයි. එනම්,

- කෙනෙකුගේ සිතුවිලි ප්‍රකාශ කිරීම
- වෙනත් කෙනෙකුගේ සිතුවිලි දැන ගැනීම
- අදහස් ප්‍රකාශ කිරීම
- අදහස් හුවමාරු කර ගැනීම යනුවෙනි (සේනාධීර හා හේවාපතිරණ, 2010: 61).

භාෂාමය අත්දැකීම් ලබා දීමේ ප්‍රයෝජන සහ වැදගත්කම මුතුලිංගම් (1979) මෙසේ විස්තර කර ඇත. ''භාෂාව තමා අවට ඇති ලෝකයේ තිබෙන නොයෙකුත් ඇත් ගවේෂණය කිරීමේ හා අන්‍යයන් සමග සබඳතා ඇති කර ගැනීමේ මාධ්‍යයක් වශයෙන් ළමයාට උපකාරී වෙයි. නොයෙකුත් ද්‍රව්‍යයන් හි හා ක්‍රියාවල නම් ළමයා විසින් දැන හැඳින ගැනීමෙන් පසුව ඔහු තම ලෝකය විෂයයෙහි නව මාදිලියේ අත්දැකීම් ලබයි. අතීත හා අනාගත ලොවක් පමණක් නොව, කාල්පනික ලොවක් ද ඔහු වෙත ගෙන එනුයේ භාෂාවයි.'' (මුතුලිංගම්, 1979: 49) ළදරු අවධියේ සිට අන්‍යයන් සමග අදහස් හුවමාරු කර ගැනීමට ආධාරකයක් වන භාෂාව සමාජානුයෝජනයේ දී වැදගත් සාධකයක් ලෙසින් හඳුනා ගත හැකි ය. දෙමාපියන් තම දරුවන් ඉදිරියේ සිදු කරන කථනය දරුවාගේ පෞරුෂ වර්ධනය සඳහා ද රුකුලක් වේ.

දරුවන්ගේ පෞරුෂ වර්ධනයට මෙන් ම බුද්ධි වර්ධනයට උපයෝගි කර ගන්නා ළමා කථා, කවි ගී, දරුවාගේ රුචියට මෙන් ම වයසට ද අනුකූල විය යුතු වේ. ඒ අනුව දෙමාපියන් විසින් භාෂා සංවර්ධනය සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කිහිපයක් සේනාධීර හා හේවාපතිරණ (2010) පෙන්වා දී තිබේ.

| **භාෂාමය ලක්ෂණය** | **දියුණු කිරීම සඳහා දෙමව්පියන් ගත යුතු ක්‍රියාමාර්ග** |
|---|---|
| දරුවාගේ හැඬීම | හැඬීම මගින් දරුවා ප්‍රකාශ කරන අදහස් කෙරෙහි දෙමව්පිය අවධානය යොමු කිරීම |
| ඇනුම් ඇරීම | ළදරුවා වැඩි වේලාවක් නින්දෙහි පසුවන නිසා නින්දට සුදුසු වාතාවරණයක් සැපයීම |
| සිනහව | මවගේ, පියාගේ මුහුණ දුටු විට ප්‍රීතිය සතුට ප්‍රකාශ කිරීම නිසා එවැනි අවස්ථා වර්ධනය කිරීම |
| විවිධ ශබ්ද පිට කිරීම | වැඩිහිටි කථාව අසා විවිධාකාරයෙන් මුව සකසා ශබ්ද පිට කිරීමට උත්සාහ කිරීම නිසා, දරුවා සමග නිතර කථා බහේ නිරත වීම |
| කථාව | නිවැරදි උච්චාරණයෙන් යුක්ත කෙටි පැහැදිලි අර්ථාන්විත වාක්‍ය කථා කිරීම |
| කියවීම | පින්තූර ඇතුළත්, වර්ණවත් සරල චිත්‍ර කථා පොත් නිරීක්ෂණයට සහාය වීම |
| ලියවීම | ඩ්‍රොයින් කොල සහ පාට පැන්සල්, හුණු කූරු සපයා, ඇඳීමට සහ පාට කිරීමට අවස්ථා සැපයීම |
| නිර්මාණය | චිත්‍රයක් ඇඳීමට උපදෙස් දී ප්‍රශ්නකරණයෙන් චිත්‍රය කුමක් දැයි දැන ගැනීම |
| කථාන්තර කීම | කථාන්තරවලට අවධානය යොමු කොට සවන් දීමට සහ කථා කීමට අවස්ථා සැලසීම |
| ගී සින්දු | නිවැරදි තාලයට, අංග චලනයෙහි නිරත ව ගී සින්දු කීමට අවස්ථා සැලසීම |

(සේනාධීර හා හේවාපතිරණ, 2010: 66)

අධ්‍යාපන මට්ටම ඉහළ තත්ත්වයකට ගැනීමේ අරමුණින් දෙමාපිය ඇසුරේ සමාජානුයෝජනය වන දරුවාගේ බුද්ධිය වර්ධනය වන අයුරින් ක්‍රියාකාරකම්වල යෙදවීම ද දෙමාපියන්ගේ කාර්යභාරයේ වැදගත් අවස්ථාවකි. හේන්රි ගොඩාර්ඩ් (1919) පෙන්වා දෙන්නේ ආසන්න ගැටලු හා අපේක්ෂිත ගැටලු විසඳීමට පුද්ගලයා තුළ ඇති අත්දැකීම් සම්භාරය බුද්ධිය වශයෙන් හැඳින්විය හැකි බවයි. දරුවෙකුට නිරීක්ෂණය වන හා සංජානනය වන අරමුණු නිසි අයුරින් කළමනාකරණය කිරීම සඳහා දෙමාපියන්ගේ ඇසුර ඉතා වැදගත් ය. කුඩා කාලයේ සිට ම තම දරුවන් ඇති දැඩි කිරීමේ දී ඔවුන්ගේ බුද්ධි වර්ධනය කෙරෙහි දෙමාපියන්ගේ අවධානය යොමු වීම වැදගත් ය. ''බුද්ධිය හෝ මානසික සංවර්ධනය පුද්ගල වර්ධනයේ වැදගත් අංශයක් වන අතර එයට විවිධ මානසික හැකියා ඇතුළත් වේ. අවබෝධ කර ගැනීම, නිරීක්ෂණය, මතකය, කල්පනා ශක්තිය, චින්තනය, ගැටලු විසඳීම, බුද්ධිමය වර්ධනය මෙන් ම භාෂා වර්ධනය වැනි ගුණාංග රැසක් මානසික සංවර්ධනයට ඇතුළත් වේ'' (සේනාධීර, 2005: 64).

බුද්ධි වර්ධනයේ දී ආරය හා පරිසරය යන සාධක බලපානු ලැබේ. සෑම අයෙකුට ම ආරයෙන් අඩු වැඩි වශයෙන් බුද්ධිය පිහිටන අතර, එය විභව ශක්තිය වේ. එම විභව ශක්තිය විකසිත වනුයේ පරිසරයෙන් ලැබෙන සරු බව මත ය. දරුවා ගර්භාෂය තුළ සිටිය දී ම (පූර්ව ප්‍රසව පරිසරයේ දී) බලපාන හිතකර හෝ අහිතකර පරිසර සාධක ද (මන්ද පෝෂණය, දිළිඳු බව, නූගත් දෙමාපියන්, දුර්වල සමාජ සංස්කෘතික පරිසරය ද) ආරයෙන් නිශ්චිත වූ විභව ශක්තීන් විකසිත කිරීමට මිලාන කිරීමට හේතුවිය හැකි ය. මේ නිසා ආරයෙන් නියමිත බුද්ධිය හිතකර පරිසර සාධක මගින් සරුවට වර්ධනය කරලීම, දරුවන් හදා වඩා ගැනීමෙහි ලා නියැලි දෙමව්පියන්ගේ සහ ගුරුවරුන්ගේ වගකීම වන්නේ ය (අතුකෝරාල, 1989: 124). මේ අනුව ආරමය සාධක පෝෂණය කරමින් බුද්ධි වර්ධනය ඇති කිරීමට දෙමාපියන් විශේෂ අවධානයක් දරුවන් කෙරෙහි යොමු කළ යුතු ව පවතී. එමෙන් ම බුද්ධි වර්ධනයේ දී දරුවා සහ පරිසරය අතර සම්බන්ධතාවේ වැදගත්කම මාතුපේම (1989) මෙසේ පෙන්වා දී ඇත. දල්වන ලද චිමිනි ලාම්පුවක් දකින ළදරුවා එය ප්‍රභාමත් අලංකාර වස්තුවක් යැයි සිතයි. එය ඔහුගේ බුද්ධි සීමාව යි. එම සීමවෙහි පිහිටා ඔහු චිමිනියට ආශාවෙන් අත තබයි. ඔහුගේ අත පිළිස්සෙයි. එහි

ප්‍රතිඵලයක් ලෙසින් දැල්වෙන පහන ප්‍රභාමත් අලංකාර වස්තුවක් පමණක් නොව, අත පුළුස්සන වේදනාව ඇති කළ හැකි වස්තුවක් ලෙස ද ඔහු අවබෝධ කොට ගනී. ඉන් පසු දැල්වෙන විම්නියට අත නොතැබීමේ පුරුද්ද ඔහු විසින් ඇති කර ගනී (මාතුපේම, 1989: 36-37).

බුද්ධිය වර්ධනය වීමේ දී පුද්ගල වයස බලපානු ලැබේ. මව්පිය උරුමයෙන් ලැබෙන ජාන මගින් දරුවාගේ බුද්ධිය තීරණය වන බවත් උපතේ සිට සිය වයස අවුරුදු 15 පමණ වන තුරු පුද්ගලයා ජීවත්වන පරිසරය සමග නිරන්තර ව සිදු වන අන්තර් ක්‍රියාකාරීත්වය නිසා ද බුද්ධි වර්ධනය සිදුවන බව පියාජේ පෙන්වා දී තිබේ. එය අවධි වශයෙන් සිදු වන ආකාරය විභේදනය කොට මෙසේ පෙන්වා දී තිබේ.

| වයස | අවධිය | බුද්ධිමය ලක්‍ෂණ වර්ධනය වන ආකාරය |
|---|---|---|
| අවු. 0-2 | ඉන්ද්‍රිය චාලක | ළදරුවා පරිසරය ආශ්‍රිත ඉන්ද්‍රිය චාලක ක්‍රියාකාරකම්වල නිරත වේ. |
| අවු. 2-7 | පූර්ව ක්‍රියාකාරී | චින්තන ශක්තිය ක්‍රමයෙන් වර්ධනය වීම නිසා පරිසරයේ වස්තූන් පිළිබඳ සංකේතාත්මක ව සිතීම |
| අවු. 7-11 | සංයුක්ත චින්තනය | වස්තූන් අනුපිළිවෙළින් දක්වන දරුවා, අඩු කිරීම, එකතු කිරීම, බෙදීම, වැඩි කිරීම ඉගෙන ගනී |
| අවු. 11-15 | වියුක්ත චින්තනය | චින්තනය වර්ධනය වී ගැටලු විසඳීමේ හැකියාව ද, දෘෂ්‍යාධාර නොමැතිව අවබෝධ කර ගැනීමේ ශක්තිය ද, තර්කානුකූල ව සිතීම ද අරඹයි. |

(Zimbaro, 1980: 167; Aggarwal, 1995: 64; සේනාධීර හා හේවාපතිරණ, 2010: 70)

දාරක සමාජානුයෝජනයේ දී දෙමාපියන් විසින් උක්ත අවධිවල දී තම දරුවන්ගේ චර්යාමය සම්බන්ධතා පිළිබඳ මනා අවබෝධයෙන් යුක්ත ව බුද්ධි වර්ධනය ඇති වන ආකාරයේ කාර්යය කොටස් ඉටු කළ යුතු ව පවතී. බුද්ධි වර්ධනය සඳහා පවුලේ කාර්යය කොටස් නිසි

අයුරින් ඉටු කිරීම තුළ අන්‍යයන්ගේ හැඟීම්, අරමුණු, අභිලාස, ඉරියව්, ඉඟි ආදිය මනා ව තේරුම් ගැනීමට විශේෂ දක්ෂතාවක් දක්වන එම පුද්ගලයන් සමාජානුයෝජනයේ හා සමාජ සංවේදීතාවෙන් උසස් මට්ටමකට පත්වෙති (අබේපාල, 2010: 286).

සමාජානුයෝජනයේ දී චිත්තවේග සංවර්ධනය කෙරෙහි ද විශේෂ අවධානයක් සමාජ විද්‍යාඥයන් හා මනෝ විද්‍යාඥයන් යොමු කොට ඇත. අයහපත් චිත්තවේග වර්ධනයට ඇති ඉඩකඩ හා අවස්ථා හැකි තරම් දුරට අවම කරලමින් විනාශකාරී චිත්තවේග සංස්කරණාත්මක පැත්තට යොමු කර, පුද්ගලයා තුළ මානසික සමතුලිතතාවක් ඇති කිරීම චිත්තවේග සංවර්ධනය නම් වේ (සේනාධීර හා හේවාපතිරණ, 2010: 72). චිත්තවේග වර්ධනයට අවශ්‍ය මූලික ඇසුර දෙමාපියන්ගෙන් ලබා ගන්නා ආකාරය සිරිගමගේ පෙන්වා දී තිබේ. ඔහුට අනුව චිත්තවේග ප්‍රයෝජන දරුවන්ට අවශ්‍ය වන්නාක් මෙන් ම දෙමව්පියන්ට ද සිය දරුවන්ගෙන් චිත්තවේගී ප්‍රයෝජන ඇත. දෙමව්පියන්ගෙන් ලබා ගන්නා චිත්තවේගී ප්‍රයෝජන අතර සන්තෝෂය, ආදරය, මිත්‍රශීලීත්වය, විනෝදය ද වේ (සිරිගමගේ, 1985, 23). මනා චිත්තවේග කළමනාකරණ හැකියාව අධ්‍යාපනයට වැදගත් වන අතර සමාජානුයෝජන ක්‍රියාවලියේ දී දෙමාපියන් ඒ කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

ළදරු අවධියේ සිට ම දරුවකු චිත්තවේග අත්දැකීම් ප්‍රදර්ශනය කරන ආකාරයක් දැක ගත හැකි ය. මුතුලිංගම් (1979) පෙන්වා දෙන්නේ මාස 6ක් පමණ වූ ළදරුවාට කෝපය හා බිය හේතු කොට තම මුහුණෙහි හා වෙනත් විවෘත හැසිරීම් විෂයයෙහි ඇති වන වෙනස්කම් වෙන් වෙන් වශයෙන් හඳුනා ගත හැකි ය. තමා අවට ඇති හැමදේට ම පහර දෙමින් ඔහු තම කෝපය ප්‍රකාශ කරනු ඇත (මුතුලිංගම්, 1979: 35). චිත්තවේග වර්ධනය සඳහා දෙමාපියන් විසින් ගත යුතු ක්‍රියාමාර්ග කිහිපයක් අතුකෝරාල පෙන්වා දී ඇත.

- ළමයාට ආදරය හා සුරක්ෂිතාව දෙන්න.
- ළමයා එළඹ සිටින අවස්ථාව අවබෝධ කර ගෙන, ඒ අවස්ථාවට ගැළපෙන අයුරින් හැකි තාක් පූර්ණ සංවර්ධනය සඳහා ළමයාට අවකාශ සලසා, ඊළඟ

අවස්ථාවට එළඹීම පහසු කිරීම සඳහා කළ හැකි හැම දෙයක් ම කරන්න.

- ඇතැම් අවස්ථාවල දී ළමයාගේ ක්‍රියා සීමා කිරීමටත්, ඔහු ඉච්ඡාභංගයට පත් කිරීමත් (දඬුවම් දීම වැනි අවස්ථාවල දී අවශ්‍ය වන බව වටහා ගන්න. ආදර බර එහෙත් අවශ්‍ය වූ විට දැඩි ලෙස සිටීම මනෝ විද්‍යාත්මක පරිණතිය සඳහා ආධාරකාරී වේ. පමණ ඉක්මවා සුරතල් කිරීමත්, පමණ ඉක්මවා ඉඩ දීමත් දරුවාගේ චිත්තවේග වර්ධනය දුබල කරලයි. නැතහොත් ඌන වර්ධනයක් ඇති කරයි (අතුකෝරාල, 1994: 91).

දරුවන්ගේ චිත්තවේග වර්ධනය සඳහා දෙමාපියන් විසින් විධිමත් ලෙස සමාජානුයෝජනයට ආධාර නොකිරීම දරුවන් අපගාමී චර්යාවන් සඳහා නැඹුරු වීමේ සම්භාවිතාව ධනාත්මක වන බව ලොවෙල් පෙන්වා දී ඇත. දෙමාපියන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම නොසැලකිල්ල හා අවරෝධනය පිළිවෙළින් සිය දරුවන් කෙරෙහි පසු කලෙක ඇතිවන ආක්‍රමණශීලී, අපචාරී හෝ නිශේධ හැසිරීම් සමග සම්බන්ධ වේ (ලොවෙල්, 1981෴ 241).

සමාජයක් විසින් පිළිගත් සමාජ ධර්මතාවන්ට අනුගත වීමේ මූලික පුහුණුව පවුල ආශ්‍රිත ව ඇති කර ගනී. එහි දී සදාචාර වර්ධනය දරුවා තුළ ගොඩ නැගේ. සදාචාර වර්ධනය වූ දරුවකු තුළ දැකිය හැකි ලක්ෂණ වන්නේ අවංකකම, කරුණාව, දයාව, කීකරුකම යනාදී ඇගයුම් ය. පවුල මුල් කර ගෙන ගොඩ නැගෙන එවැනි සදාචාර ඇගයුම් දෙමව්පියන් විසින් දරුවන්ට ආදර්ශයෙන් හා අවවාදයෙන් පුහුණු කිරීම ඉතා වැදගත් ය. සමාජ සම්මත යහපත් සාරධර්ම ළමයාට කියා දීමෙන් ද සමාජයට නොගැළපෙන දේ ප්‍රතික්ෂේප කිරීමට දිරි ගැන්වීමෙන් ද දරුවකුගේ සදාචාර වර්ධනය සිදු කළ හැකි ය. මේ පිළිබඳ ව ලොවෙල් (1981) ඉදිරිපත් කරන ලද අදහස මෙහි දී වැදගත් වේ.

අවංකභාවය, මුසා බස් දෙඩීම, වංචනය, හිංසනය, ආත්මාර්ථකාමීත්වය වැනි කරුණු ළමයින්ට ඉගැන්වීමේ දී දෙමාපියන්

සහ ගුරුවරුන් විසින් උපයෝගි කර ගත යුත්තේ හුදෙක් අවවාද හා දේශනා කිරීම නො ව ළමයින්ගේ එදිනෙදා අත්දැකීම් මගින් ලත් පාඩම් ඔවුන් සිත් තුළ කාවැද්දවීමේ ක්‍රමය වේ (ලොවෙල්, 1981: 230).

සදාචාරාත්මක චර්යාවන්ගෙන් යුත් පෞරුෂයක් දරුවකු තුළ ගොඩ නැගීමේ දී පවුල ඉතා වැදගත් බව ලොවෙල්ගේ උක්ත උපුටනයෙන් හඳුනා ගත හැකි ය. දෙමාපියන්ගේ හැසිරීම් අනුකරණය කිරීමෙන් හා ආකල්ප තදාත්මීකරණය කිරීමෙන් ළමයින් සදාචාරාත්මක සංවර්ධනය ගොඩ නගා ගනි. එමෙන් ම විවිධ ත්‍යාග දීමෙන් හා වැරදිවලට දඬුවම් දීමෙන් ද ළමයින් තුළ සමාජ ධර්මතාවන්ට ගරු කිරීමට පුහුණු කිරීම දෙමාපියන්ගේ කාර්යභාරය ලෙසින් පෙන්වා දී ඇත (මුතුලිංගම්, 1979). එමෙන් ම සමාජ හුරුව හා පෞරුෂ වර්ධනය ද දෙමාපියන් විසින් දරුවන් සමාජානුයෝජනය කිරීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන අවස්ථා ලෙසින් හැඳින්විය හැකි ය.

**නිගමන**

සමාජානුයෝජනය අධ්‍යාපනයට ආධාරකයක් ලෙසින් උපයුක්ත වන බව හඳුනා ගත හැකි ය. පවුලේ භූමිකාව තුළ වැඩිහිටියන් සමාජ නීතිරීතිවලට ගරු කිරීමෙන් සමාජ ඒකාබද්ධතාව සඳහා දරුවාගේ අනුවර්තනය සිදු කළ යුතු අතර එයින් දරුවා විධිමත් අධ්‍යාපනයට අවශ්‍ය මූලිකාංග සම්පූර්ණ කර ගනි. එහෙත් සමාජීය වශයෙන් විස්තාරනය කරන ලද සම්මත හා සාරධර්ම මාලාවට දෙමාපියන් ගරු නො කරන්නේ නම් ඔවුන් ඌන පෞරුෂ පද්ධතියකින් යුක්ත පුද්ගලයෙක් බිහි කරනු ලැබේ. එය දරුවාගේ විධිමත් අධ්‍යාපනයට මෙන් ම සමාජ පැවැත්මට බාධා පමුණුවන මූලාශ්‍රයක් ලෙසින් හඳුනා ගත හැකි ය.

දරුවා වැඩෙන විට පවුලේ භූමිකාව වෙනස් වුව ද දරුවෙකු පිළිබඳ ව දෙමාපියන්ට ඇති වගකීම අඩුවන්නේ නැත. දෙමාපියන් කෙතරම් කාර්යබහුල වුවත් දරුවන් පිළිබඳ ව හා ඔවුන්ගේ කාර්ය කොටස් නිසි කලට නිසි අයුරින් අභ්‍යන්තරීකරණය කළ යුතු ව ඇත. දරුවෙකු සමාජයට ගැළපෙන චර්යා පද්ධතියකින් යුක්ත ව සමාජගත වන විට සමාජ චලතාව හමු වේ. ධනාත්මක සාධනයකට ඔහු හෝ ඇය යොමු වන්නේ ය. ඒ සඳහා දෙමාපියන් දරුවන්ගේ චාලක

හැකියා වර්ධනය, භාෂා හැකියා වර්ධනය, චිත්තවේග වර්ධනය, බුද්ධිමය වර්ධනය සදාචාර වර්ධනය, පෞරුෂ වර්ධනය යන සුවිශේෂී ලක්‍ෂණ කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

දරුවෙකුගේ සමාජ කුසලතා වර්ධනය වීමේ දී වැදගත් අවස්ථාවක් ලෙසින් පවුලේ සාමාජිකයන්ගේ ඒකාබද්ධතාව හඳුනා ගත හැකි ය. ඒකාබද්ධතාව සඳහා සියලු දෙනා එක අවස්ථාවක දී හමු වන කෑම මේසය වැදගත්කමක් දරන බව හඳුනා ගෙන ඇත. ආහාර වේල සමග දරුවන් ආචාරශීලී ව මැදිහත් වීම, පවුලේ සහජීවනය, සමගිය හා අයිතිවාසිකම් පිළිබඳ ව හැඟීම වර්ධනය වීම වැනි තීරණාත්මක මනෝභාව සංවර්ධනය සඳහා හේතු වී ඇත. ''පවුල සමග ආහාර ගැනීම දරුවන්ගේ පෝෂණ කාර්යය පමණක් නොව ඉන් එහා ගිය වටිනාකම් රාශියක් ගොඩ නැගේ. මෙම වටිනා කාලය තුළ ඔවුනොවුන් අතර සන්නිවේදනය, අදහස් වෙනස් කිරීම්, විහිළු කියවීම, සිනාසීම වැනි වටිනාකම් රාශියකට කදිම අවස්ථාවකි. පවුලේ ආහාර වේල යනු සෙනෙහස, හැඟීම, දෙමාපියන් සහ දරුවන් අතර බැඳීම ශක්තිමත් කළ හැකි අවස්ථාවක් ද වේ''. මේ සියල්ල දරුවන්ගේ සමාජානුයෝජන කාර්යයේ දී ඉතා වැදගත් කුසලතා ලෙසින් හැඳින්විය හැකි ය. ''දරුවන් සමාජගත කිරීමට අවැසි දිශානතිය හා සාරධර්ම සමුච්චය පවුල වන අතර එය සැබෑ සමාජකරණ සඳහා ආදරණීය පරිසරයක් හා හැඟීම් ඇති කරන පාසලකි'' (Osterrieth, 1976: 134).

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අතුකෝරාල, ඩී. ආර්. (1989). *අධ්‍යාපන මනෝ විද්‍යාව හා ගුරුවරයා.* පානදුර: ශික්‍ෂා මන්දිර ප්‍රකාශන.

අබේපාල, ආර්. (2010). *අධ්‍යාපනයේ මනෝ විද්‍යාත්මක පදනම,* කොට්ටාව: සාර ප්‍රකාශන.

මාතුපේම, පී. ඒ. (1989). *නූතන මනෝ විද්‍යා ප්‍රවේශය.* කලුතර, සත්සර.

මුතුලිංගම්, එස්. (1979). *අධ්‍යාපන මනෝ විද්‍යාව හා මිණුම්.* කොළඹ: සමයවර්ධන ප්‍රකාශන.

ලොවෙල්, කේ. (1981). *අධ්‍යාපන මනෝ විද්‍යාව හා ළමයි.* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

සේනාධීර, සිල්වී හා හේවාපතිරණ, චිත්‍රාංගනී. (2010). *අධ්‍යාපනය සඳහා සමාජානුයෝජන කාරකවල වැදගත්කම.* කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනාධීර, එස්. (2005). *ළමා වර්ධනය හා සංවර්ධනය - ගුරුවරුන්ට හා දෙමාපියන්ට මාර්ගෝපදේශ ග්‍රන්ථයක්.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Aggarwal, J.C. (1995). *Essentials of Educational Psychology.* New Delhi: Vikas Publishing.

Cooly, C.H. (1902). *Human Nature and Social Oder.* New York: CharlesScribner's Sons.

Freud, S. (1923). *The ego and the Id.* Standard Edition 19: London.

Goffman E. (1959). *The presentation of self in everyday life.* New York: Doubleday Anchor.

Krech, D., Crutchfield & Ballachey, E. (1962). *Individuals in Society.* A Textbook of Social Psychology. New York: McGrow Hill.

Mead G.H. (1934). *Mind, self, and society,* Chicago, IL 610 : University of Chicago Press.

Osterrieth, P. (1976). I*ntroduction to child psychology,* Bucharest: Didactica si Pedagogica.

Zimbardo, P.G. & Ruch, F.L. (1980). *Essentials of Psychology and Life.* US:Scott, Foresman.